# හෙළ ගැමි දිවිය හා ජනකවිය

අපේ ජනසාහිත්‍යයට ඇත්තේ ඉතා දිග ඉතිහාසයෙකි. එය චූකලී ඉතා පුළුල්ය. විවිධ අංගවලින් සමන්විතය. සම්භාව්‍ය සාහිත්‍යය නොවේ නම් ලිඛිත සාහිත්‍යය සේම ගද්‍ය පද්‍ය දෙකින්ම යුතු ජන සාහිත්‍යය මෙරට පොදු ජනයාගේ මුවගින් උපන්නකි. ඔවුන් විසින්ම පරපුරින් පරපුරට පවත්වා ගෙන ආවකි. ගද්‍යයෙන් මෙන්ම පද්‍යයෙන්ද නිර්මිත ඓතිහාසික ප්‍රබන්ධ, ආඛ්‍යාන, නාට්‍ය, වත් පිළිවෙත්, උපදේශ, ප්‍රස්තා පිරුළු ආදී විවිධාංගයන් ජන සාහිත්‍යයෙහි ඇතුළත් වෙයි. ජනකවිය එහි ඉතා වැදගත් අංගයෙකි. වෙසෙසින්ම අපේ ගැමි සංස්කෘතිය, ඒ හා බැඳුණු සුන්දර භෞතික පරිසරය ඇසුරුකොට උපන්, ගායනයත් ශ්‍රවණයත් උදෙසාම නිමවනලද, ගැමියන්ගේ පැසුණු නුවණද ඔවුන්ගේ ගතිගුණද අභිරුචියද, රසිකත්වය ද, හපන්කම්, මෝඩකම් හා පුරසාරම් ද පිළිබිඹුවන ආකර්ෂණීය පද්‍ය සුවිශාල ප්‍රමාණයක් එහි ඇතුළත් වෙයි. ඒ චූකලී අවශ්‍යයෙන්ම පැරණි සිංහල ගැමි ජනයාගේ පෘථුල ජීවන අත්දැකීම් පිළිබිඹුකරන විශිෂ්ට සාහිත්‍යාංගයෙකි.

විදග්ධයන් විසින් සම්භාවිත වූ කාව්‍යකරණය පිළිබඳ ශාස්ත්‍රීය අවදිකමක් සාමාන්‍ය ගැමියනට නොවූ බව අමුතුවෙන් කිවයුතු නොවේ. නිර්මාණ හෝ වින්දනය අරබයා ගුරු ඇසුරින් හෝ පොත පතින් ලත් එබඳු දැනුමක් නොවූ බැවින්ම ඔවුහු ආයාසයකින් තොරව කවි නිමවා ගැයූහ. නිතැතින්ම මුවට නැගුණු සිතුවිලි කවි බවට පත් කළෝය. එබැවින්ම සාම්ප්‍රදායික කවි කලාවේ වැට කඩොලුවලින් නිදහස් වූ ඔවුහු රිසිසේ ගැයූහ.එහෙත් ඒ සංයමයෙකිනි. ගැමි දිවියට ආවේණික වූ මානසික හා වාචික ශික්ෂණය ඔවුන්වෙත වූයේය. බුදු දහම් ඇසුරින් ලත් ඒ ශික්ෂණයට අනුගත වූ ඇගයීම් නොඉක්මවායාමද සිදුවූයේ නිතැතිනි. එසේ සදාචාර සීමාවන් තුළ රැඳුණේ වී නමුදු, එය නිර්මාණයට හා වින්දනයට ආවරණයක් වූයේ නැත. එම සීමාවන් ඔවුන්ගේ රසඥතාවයද කුසලතාවයද හිරකර තැබූ බවක් නො පෙනෙයි. මෙකී නිදහසත් සංයමයත් හා එක්වූයත් අව්‍යාජත්වයත් ජන කවියෙහි සැබවින්ම දැකගත හැකිය. ඔවුහු ඉතා විවෘතව අව්‍යාජව ගැයූහ. ව්‍යාජ සංවේග සාඩම්බර වදන්වලින් තොරව, කුහක චින්තනයෙන් බැහැරව නිදහසේ එහෙත් සංයමයෙකින් යුතුව ගැමි මුවට නගන ලද බැවින්ම ජන කවිය රසවත් වූයේ ය. ඒ ගැමියෝ ගමේ ගැමි ජීවිතයේ ඇත්ත ඇති සැටියෙන්ම කීවෝය.

පන්සලෙන් හෝ ගුරු ගෙදරින් ලත් මූලික දැන උගත්කම හැරුණු විට අනේකවිධ ධර්ම ශාස්ත්‍රාදිය ඇසුරුකොට ගත් මහ දැනුම් බරක් ගැමියනට නොවූයේ ය. ගැඹුරු පොත පතින් ලත් එබඳු දැනුමක් නොවූවද අපේ ගැමියන් මෝඩයින් වූයේ නැත. ඔවුහු ජීවිතය හා සමාජයද පිළිබඳව පැසුණු නුවණ ඇත්තෝ වූහ. ඒ බවට අපේ ජන කථා මෙන්ම ජනකවිද නිදසුන් සපයයි. ගැමියන්ගේ ඒ පැසුණු නුවණට බෙහෙවින්ම පාදක වූයේ ඔවුන්ගේ අත්දැකීම ය. ජීවිතයේ සුන්දරත්වය මෙන්ම කටුකත්වය ද සුව සම්පත් මෙන්ම දුක් දොම්නස් ද මැදිහත්ව අත්විඳි ඔවුහු ඒ තුළින්ම පැසුණුබව ලද්දෝය.

රන් විමනේ සිටිමුත් දුක නැති වේද්ද
පැණි මීයේ කෑ මුත් බඩගිනි නැද්ද
මිණි බරණින් සැදිමුත් ගත නොදිරද්ද
පැණි වරකා ගහටත් හෙණ නොවදිද්ද

රන් විමානයෙක සිටියේ වී නමුත් දුක නැතිවෙන්නේ නැත. ජරා ව්‍යාධි මරණාදිය දුකය. එය ඉක්මැවීමට සමත් ලෞකික වූ සැපතක් නැත. සියල්ල පෙරළෙයි, වෙනස් වෙයි. මේ හෙළ ජන කවියා බුදු දහමින් ලත් ජීවන දැක්මය. මී පැණි ගැමියන් දන්නා මිහිරිතම කෑමකි. කැවේ ඒ සුමිහිරි කෑම වුවද එමගින් ලබන සතුට සුවය තාවකාලිකය. නැවත බඩගිනි වන බැවිනි. සෝභනය කැමැත්තෝ අගනා මැණික්, ආභරණ ආයිත්තම් පළඳිති. එසේ සරසා ආකර්ෂණීයත්වයට පත්කළ ද

